# මැජික් පොත



ටී. ඒ. සෙනුදි දිනෙත්යා මුණසිංහ

| | |
|---|---|
| කෘතියේ නම | මැජික් පොත |
| කතෘගේ නම | ටී.ඒ. සෙනුදි දිනෙත්‍යා මුණසිංහ |
| කතෘ අයිතිය ඇතුළු විස්තර | ISBN 978 – 624 – 206 – 722 - 3 |
| කතෘගේ වෙනත් කෘති | |
| කෘතිය පල කරන දින | 2023 – 11 - 15 |

## පිදුම

කුඩා කල සිට

අකුරු කියා දුන්

සියලුම ගුරු මැණිවරුන්ට හා ගුරුපියවරුන්ටත්

මගේ දෙමව්පියන්ටත්

මෙම පොත ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ  ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එකතු වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 11. 01

සඳුනි කියලා දැරියක් සිටියා.ඇය චිත්‍ර ඇඳීමට ඉතා ආසා කළා.චිත්‍ර ඇඳීමට ඇති ආසාව නිසා ඇය අතට අසුවන සෑම දේයක ම චිත්‍ර ඇන්දා.එක දවසක් ඇයට බිම වැටී ඇති පොතක් හමු වුණා .ඇය ඒ පොතේ ඇතුළේ තිබෙන දේවල් බලන්න යැයි සිතා පොත විවෘත කළා.පොතේ කිසිම දෙයක් නොතිබුණු නිසා ඇය එම පොත ගෙදර අරන් ගියා.



ඇය එම පොතේ ලස්සන උද්‍යානයක් ඇන්දා. එකපාරටම සඳුනි එම උද්‍යානයෙන් මතුවුණා. ඇය ගොඩක් බය වුණා.ඊට පස්සේ ඇය ඇයගේ නිවස ආපසු ඇන්දා. ඇය එවිට ආපසු ගෙදරින් මතුවුණා. ඇය ගොඩක් සතුටු වුණා ඇය ආපසු ගෙදර ඒම ගැන.



තවත් දවසක් ඇය ලස්සනට හිමාල කන්ද ඇන්දා.හිමාල කන්ද අඳින්නට පෙර ,ඇය හිම කබාය , සපත්තු හා තොප්පිය ඇඳගත්තා. ඉන්පසු ඇය හිමාල කන්දෙන් මතුවුණා.



ඇය කන්දෙන් ටිකක් පහළට ගියා. ඉන්පසු ඇය ආපසු ගෙදර ඇන්දා. ඇය ගෙදර ගොස් සිතන්නට පටන් ගත්තා.



ඇය මුහුදු පතුල දැක නොමැති නිසා මුහුදු පතුල චිත්‍රයට නගන්න ඇය තීරණය කළා . හුස්ම ගැනීමට අවශ්‍ය දේවල් සහ පිහිනීමට අවශ්‍ය දේවල් ඇය සොයා ගත්තා. ඉන්පසු ඇය මුහුදු පතුල ඇන්දා. එවිට ඇය මුහුදු පතුලෙන් මතුවුණා.



ඇය දැක්කා ඩොල්පින්ලා කිහිප දෙනෙක් බෝල ගහනවා. ඇයට පුදුම හිතුනා , ඩොල්පින්ලා බෝල ගහනවා දැකලා.ඩොල්පින්ලා ඇයට බෝල ගැසීමට ආරාධනා කළා. සඳුනි පුදුමයෙන් ඩොල්පින්ලා සමග බෝල සෙල්ලම් කිරීමට පටන් ගත්තා. අනතරුව ඇය ඩොල්පින්ලාට සමු දී ආපසු ගමන බලා පිටත් වුණා.

ඇය දැක්කා ලොකු මුතු බෙල්ලන් කිහිප දෙනෙක් ඇයට සිනා වෙනවා. ඇයිත් මුතු බෙල්ලන්ට සිනා වී ආපසු ගමන ආරම්භ කළා.



කක්කුටු හාමිනේ කෙනෙක් සහ කක්කුටු හාමි කෙනෙක් රණ්ඩු වෙනවා ඇයට ඇසුනා. ඇය පරිස්සමින් එතැනට ළං වුණා .බලන්න සඳුනි , මම මගේ මිතුරිය හමුවෙන්න ගිය වෙලාවේ මගේ මහත්තයා ළමයිව බලාගෙන නැහැ. කක්කුටු හාමිනේ සඳුනිට කිව්වා.



එම ශබ්දය ඇසී ,එතනට කැස්බෑ අත්තම්මා පැමිණියා. මොකද මොකද මේ රණ්ඩුව? කැස්බෑ අත්තම්මා ඇසුවා. අර බලන්න!ළමයි ටික බය වෙලා ගල් අස්සේ හැංගිලා.

ළමයි ඉන්නකොට රණ්ඩු වෙන්න එපා.කැස්බෑ අත්තම්මා කිව්වා.සඳුනිත් ඒක අනුමත කළා.පුංචි කක්කුටු පැටව් ටික කැස්බෑ අත්තම්මා  ළඟට දුවගෙන ආවා. අත්තම්මා පැටවුන් සමග ගෙදරට ගියා.



සඳුනි එතනින් පිටත්ව ඉදිරියට යන විට දැක්කා දම්වැලකට අසු වූ තල්මස්සු පැටියෙක් උදව් ඉල්ලා අඬ අඬා ඉන්නවා.සඳුනි එතනට ඉක්මනින් ගොස් තල්මස් පැටියාව බේරා ගත්තා. මිනිස්සු සතුන්ට කොච්චර කරදර කරනවද? සඳුනිට හිතුනා. මෙහෙම කල්පනා කරනකොට ලොකු මෝරෙක් සඳුනිව ගිල්ලා. සඳුනි හොඳටම බය වුණා .බුදු අම්මෝ,මෝරෙක් මාව ගිල්ලා. සඳුනි කෑ ගැහුවා.



මොකද මොකද පුතේ ඔයා කෑ ගහන්නනේ , මෝරා කියනවා සඳුනිට ඇසුනා. සඳුනි පුදුම වෙලා ඇස් ඇරලා බැලුවා. ඇය දැක්කා ඇයගේ ඇඳ ළඟ අම්මා ඉන්නවා .



අම්මේ , මම සිහිනයක් දැක්කා , කියා සඳුනි සිහිනය අම්මට විස්තර කළා. අම්මා සඳුනිගේ ඔළුව අතගාලා, කුස්සියට ගියා. කෝ මගේ පොත, සඳුනි වටපිට බැලුවා. පොත මේසය උඩ තිබුණා. ඇය පොත පෙරළා බලන විට එහි උද්‍යානයක් , හිමාල කන්ද සහ මුහුදු පතුල ඇඳ තිබෙනවා ඇය දැක්කා. ඒ පිළිබඳ තොරතුරු ද සඳහන් වී තිබුණා. පෙරදින රාත්‍රියේ මෙම පොත කියවා නිදාගත් බව ඇයට මතක් වුණා. ඇයගේ අපූරු සිහිනය ඇය චිත්‍රයට ද නැගුවා .



පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදු වන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත් කතුවරයන් ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන්ට මෙම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවියේ දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකයේ දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක 2023. 11. 01